## මහජන නිවේදනයයි

## ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ "ඒ" තත්වයට උසස්වීම

ජාතික මානව හිමිකම් ආයතනයන් පිළිබඳ විශ්ව සන්ධානය (GANHRI) විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව "ඒ" ශ්‍රේණිය හිමි කොමිෂන් සභාවක් ලෙස ශ්‍රේණිගත කොට ඇති බව මහජනයා හට සතුටින් දන්වා සිටින්නෙමු. ශ්‍රේණිගත කිරීම "ඒ" ශ්‍රේණියට උසස් කිරීම සඳහා 2007 සහ 2009 වර්ෂවල දී කොමිෂන් සභාව අයදුම් කරනු ලැබුව ද එම ප්‍රයත්නයන් සාර්ථක නොවිණි.

GANHRI යනු ජාතික මානව හිමිකම් ආයතන පිළිබඳ වූ විශ්ව සන්ධානයයි. පැරිස් මූලධර්මයන්ට (1993) අනුකූලව ජාතික මානව හිමිකම් ආයතනයන් මෙම ගෝලීය සන්ධානයේ පූර්ණ සාමාජිකත්වය දැරීමට සුදුසු වන්නේ ද යන්න නිර්ණය කිරීම මෙහි එක් ප්‍රධාන කාර්යක් වේ. ජාතික මානව හිමිකම් ආයතනයන්හි විශ්වාසනීයත්වය සහ සාධනීයත්වය නිර්ණය කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් මෙම මූලධර්ම ගෝලීය ප්‍රමිතීන් ලෙස ලෙස පිළිගැනීමට ලක් කොට ඇත.

පැරිස් මූලධර්මයන් යටතේ මූලික අවශ්‍යතාවයක් වන්නේ දේශීය මානව හිමිකම් යාන්ත්‍රණයන් නීතියෙන් පමණක් නොව තම කාර්යභාරය ඉටුකිරීමෙහිදී ද දේශපාලනික ස්වාධීනත්වය විදහා දැක්වීම වේ. සාමාජිකයන් තෝරාගැනීමේ හා පත්කිරීමේ ක්‍රියාවලිය, ධූරයෙන් පහ කිරීමේ ක්‍රියාවලිය සහ එමෙන්ම තමන්ගේ ක්‍රියාකාරකම් වලදී ආයතනික දේශපාලන ස්වාධීනත්වය පෙන්නුම් කරන්නේ ද යන්න මෙහි සියුම් ලෙස ඇගයීමට ලක්වේ.

තවදුරටත් ජාතික ආයතනය සමාජයේ ඇති විවිධත්වය පෙන්නුම් කළ යුතු අතර ජත්‍යාන්තරව පිළිගත් මානව හිමිකම් සුරකීම සඳහා පුළුල් වරමක් එයට හිමි වී තිබිය යුතුය. එමෙන්ම විමර්ශන කටයුතු සඳහා ප්‍රමාණවත් සම්පත් ද ආයතනය සතු වී තිබිය යුතුය.

2018 ජනවාරි මාසයේ ඉදිරිපත් කොට ඇති දත්ත මගින් පෙන්නුම් කරන්නේ මේ දක්වා ශ්‍රේණිගත කිරීම් සඳහා සමාලෝචනයට ලක් කරන ලද මානව හිමිකම් ආයතන 120ක් අතුරින් "ඒ" ශ්‍රේණියට පත් කරන ලද්දේ ජාතික ආයතන 77ක් පමණකි. "ඒ" ශ්‍රේණිය හිමි ජාතික මානව හිමිකම් ආයතන ඇති දකුණු ආසියාතික රටවල් වන්නේ ඉන්දියාව හා නේපාලය පමණක් වන අතර, ආසියා ශාන්තිකර කලාපය පිළිබඳ සලකා බැලූ විට "ඒ" ශ්‍රේණියට ඇතුළත් ජාතික මානව හිමිකම් ආයතන ඇත්තේ රටවල් 15ක පමණි.

වසර දෙක හමාරක් වැනි කාලයක් තුල ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඉහළ ශ්‍රේණියකට පත් කරනු ලැබීම අප ආයතනය විසින් ලබා ගත් ජයග්‍රහනයක් පමණක්ම නොව එය 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරවා ගැනීම තුලින් ස්වාධීන කොමිෂන් සභා ශක්තිමක් කිරීම ඉල්ලා සිටියා වූ ශ්‍රී ලංකාවාසී ජනතාවගේ ජයග්‍රහනයක් ද වන්නේය. මෙමඟින් කොමිෂන් සභාව තවදුරටත් තම කටයුතු මහත් පරිශ්‍රමයකින් යුතුව කිරීමට ධෛර්ය සම්පන්න වී ඇති බව ප්‍රකාශ කරන්නෙමු.

කොමිෂන් සභාවේ කාර්යභාරය ඉටු කිරීම සඳහා ධෛර්ය හා සහයෝගය ලබා දුන් සියළුදෙනා හට මෙහිදී අප කෘතඥ වෙමු. එහිදී ව්‍යවස්ථාදායක සභාවේ සභාපතිතුමා විසින් ලබා දෙන ලද අද්විතීය සහයෝගය සුවිශේෂයෙන් සිහිපත් කළ යුතු වේ.

සභාපතිනි
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
2018 මැයි 30.

**Dr. N. D. Udagama**
Chairperson
Human Rights Commission of Sri Lanka